# දික්වැල්ල ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමග එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් මිළදී ගන්නා ලද රු. 42,300 ක් වටිනා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 28 දින එකතු කරන ලද රු.40,543 ක් වූ දික්වැල්ල මහජන පොළ බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර නොතිබුණෙන් වර්ෂයේ ආදායම අඩුවෙන් දැක්වුණි.

(ඇ) 2012 වර්ෂයේ රු.1,951,626 ක බලපත්‍ර ගාස්තු බිල් කිරීම බලපත්‍ර ගාස්තු ගිණුමේ දෙවරක් සටහන් වීමේ වරද නිවැරදි කිරීම සඳහා බලපත්‍ර ගාස්තු පාලන ගිණුම බැර කර සමුච්චිත අරමුදල් ගිණුම හරකළ යුතුව තිබුණද ජර්නල් සටහන් අංක 32 මගින් බලපත්‍ර ගාස්තු පාලන ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ පොදු ගිණුම හා මාර්ග ගිණුමට අදාලව පිළියෙල කර ඇති 2014 මාර්තු මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, 2012 හා 2013 වර්ෂවලට අදාල චෙක්පොත් ගාස්තු හා චෙක්පත් අගරුවීමේ ගාස්තු රු.45,790 ක මුදලින් රු.30,040 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමටද රු.15,750 ක මුදලක් සමුච්චිත අරමුදලටද ගැලපුම් කළ යුතුව තිබුණද එසේ ගැලපුම් නොකිරීම නිසා එකී වියදම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

1.3.4 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 08 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.61,012,920 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.5,408,298 ක් වූයෙන් වෙනස රු.55,604,622 ක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂයන්හි එකතු වටිනාකම රු.138,311,971 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සේවක ණය රු.3,907,625 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.52,592,601 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ 2013 දෙසම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.627,340 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.80,589,896 ක් විය.

2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂයේ ඌන කාරක ප්‍රාග්ධනය රු.93,217,489 ක්ද සමාලෝචිත වර්ෂයේදී එය රු.1,466,884 ක් වූ අතර දිගින් දිගටම ඌන කාරක ප්‍රාග්ධනයක් පවතින බවත් ඒ අනුව කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ දුර්වලතාවයක් ඇති බවත් නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,447 | 1,991 | 1,393 |
| බදු කුලී | 5,551 | 2,818 | 1,522 |
| බලපත්‍ර ගාස්තු | 852 | 589 | 109 |
| වෙනත් ආදායම් | 41,263 | 33,508 | 127,009 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

(අ) හිඟ වරිපනම් බදු

(i) සමාලෝචිත වර්ෂයේ බිල්කර තිබුණු වරිපනම් බදු මුදල රු.1,408,085 ක් වූ අතර එකී මුදලින් අයකරගතව හැකිව තිබුනේ රු.703,235 ක් පමණක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 50 ක් විය. එසේම සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි රු.1,373,826 කින් අයකරගෙන තිබුනේ රු.716,429 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 53 ක් විය. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 වගන්තිය අනුව ආදායම් බලධාරියා වන සභා ලේකම් හිඟහිටි වරිපනම් බදු අයකර ගැනීම සඳහා පනතේ 158(1)(ඇ) වගන්තිය කෙරේ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) හිඟ බදු කුලී

සමාලෝචිත වර්ෂය ආරම්භයේ බදුකුලී හිඟ මුදල රු.1,379,496 ක් වූ අතර, එකී හිඟ මුදලින් වර්ෂය තුල රු.494,856 ක් ලැබී තිබුණි. ඒ අනුව 2012 හා ඉකුත් වර්ෂවලට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට හිඟමුදල රු.884,646 ක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 35 ක් විය.

(ඇ) මුද්දර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු රු.10,995,563 ක් විය.

(ඈ) කඩ කාමර කුලී

සභාවට අයත් කඩ කාමර 18 කින් 2013 දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී මුදල රු.974,022 ක් අදාල කඩකාමර හිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වෙළඳ බලපත්‍ර ගාස්තු

ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයට බලපත්‍ර අයකළ යුතු ව්‍යාපාර සම්බන්ධයෙන් පිළියෙල කර ඇති ලේඛනය හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමේ ලේඛනය අනුව වෙළඳ ව්‍යාපාර 31 කින් රු.27,500 ක මුදලක් බලපත්‍ර ගාස්තු ලෙසට අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

රදම්පල පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම (උපමාන පාදක ප්‍රදාන)
---------------------------------------------------------------------------

2012 වර්ෂයේ සංවර්ධන සැලැස්මෙහි, උපමාන පාදක ප්‍රදාන යටතේ ලද ප්‍රතිපාදන මගින් රදම්පල පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ 2012 නොවැම්බර් 13 දින රු.3,545,278 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර දෙවන කොටස් ගෙවීම මගින් රු.2,081,910 ක මුදලක් ගෙවා තිබුණි.

මෙම පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම මගින් පාසැල් ළමුන්, තරුණ තරුණියන්, වැඩිහිටියන් 250 කට ප්‍රතිලාභ සැපයීමට අරමුණු කරගෙන තිබුණි. එහෙත් ඉදිකිරීම නිම කිරීමට වර්ෂයකට අධික කාලයක් ගතකර ඇතත් වැඩ නිමකර මහජන යහපතෙහි නොයෙදීමෙන් සභාව මෙතෙක් දරන ලද රු.2,081,910 ක මුදල ඵල රහිතවී තිබුණි.

3.2 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වී නොතිබුණි.

3.3 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

3.4 නොවිසඳී ඇති විගණන විමසුම්
-----------------------------------

| විමසුම් අංකය හා දිනය | කාරණය | නිරීක්ෂණ |
|---|---|---|
| එස්එන්/එම්ආර්/බී/දික්.ප්‍රා.ස./මූ.වි./2012/01(7) 2012 ජුලි 05 | අංක එල්/9440 හා එම්/7253 දරන නඩු සඳහා රු.1,566,416 ක වන්දි මුදල් ගෙවීම | 2012 ජුලි 19 දිනැති සභාපතිවරයාගේ පිළිතුරු ලිපියෙන් සභාවේ නොසැලකිල්ල හා අකාර්යක්ෂමතාවය නිසා මෙම වියදම දැරීමට සිදුව ඇති බවත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 119 අනුව වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව කටයුතු කරන බවත්, පිළිගෙන ඇත. වගකිවයුතු පුද්ගලයන් හඳුනා ගෙන කටයුතු කිරිම 2014 මැයි 20 දිනැති විගණන සාකච්ඡාව අවස්ථාව වන විටද සිදුව නොතිබුණි. |
| එස්එන්/එම්ආර්/බී/දික්.ප්‍රා.ස./මූ.වි./2012/01(1) 2012 මැයි 17 | පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ADB-2201 SRI (SF) අරංකහදෙනිය සමන්මල්වත්ත මාර්ගයේ කොන්ක්‍රීට් මිශ්‍රණයේ නිව්ටන් අගය ග්‍රෙඩ් 25 ක් විය යුතු වුවද පරීක්ෂණ වාර්තාව අනුව ග්‍රෙඩ් | මාර්ග වල වැඩ තවම නිමකර නොමැති නිසා මුදල් නොගෙවීමට සභාව තීරණය කර ඇති බව 2014 මැයි 20 දිනැති විගණන සාකච්ඡාවේදී අනාවරණය වූ අතර නියමිත ප්‍රමිතියට ඉටු නොකළ වැඩ සඳහා ගෙවූ රු.8,014,457 ක මුදල |

| | | |
|---|---|---|
| | 10.6 සිට 19.9 ක් වීම හා රදම්පල උස්ගංගොඩ මාර්ගයේ කොන්ක්‍රීට් මිශ්‍රණයේ නිව්ටන් අගය ග්‍රෙඩ් 25 ක් විය යුතු වුවද, පරීක්ෂණ වාර්තාව අනුව ග්‍රෙඩ් 14.7 සිට 23.8 දක්වා අඩු අගයක් ගෙන තිබීම නිසා මාර්ගයේ ඉදිකිරීම් ඉතා දුර්වල තත්ත්වයක වීම හා නියමිත ප්‍රමිතියට නොමැතිව රු.8,014,475 ක් ගෙවීම හා ප්‍රමාද දඩ රු.3,338,858 ක් අය නොවීම. | අයකර ගැනීමද සිදුව නොතිබුණි. |

04. පද්ධති හා පාලන
------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය

ඇමුණුම.
----------

ඉඩම් හා ගොඩනැගිලි.
------------------------

| ඉඩමේ නම | ප්‍රමාණය |
|---|---|
| වලස්ගල ක්‍රීඩා පිටිය | අක්කර 01 රූඩ් 02 පර්.11 |
| ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ල | අක්කර 02 පර්.1.50 |
| දොඩම්පහල බෙලිකුඹුරේ පිහිටි කාසිගෙවත්ත ලිඳ | පර්චස් 01 |
| ඌරුගමුව බොරකන්ද පිහිටි අඹගහ දෙනියට මායිම් වූ ලිඳ | පර්චස් 03 |
| ඌරුගමුවේ මුරුතගස්පිටිය ගොරගල ඇස්ටේට් නමැති ඉඩමේ පිහිටි ලිඳ | පර්චස් 1.5 |
| ඌරුගමුවේ ඇත්තලාදෙනිය ඉඩමේ පිහිටි ලිඳ | පර්චස් 05 |
| ඌරුගමුව වේහැල්ල තුඩලෙගෙ හේනවත්ත | පර්චස් 05 |
| ඌරුගමුව දකුණ හෙට්ටි ආරච්චි ගොඩ කංකානගෙවත්ත | පර්චස් 05 |
| වත්තේගම සුදු හකුරුගෙවත්ත | - |
| දෙමපිටිය ලැබීමවත්ත බුලත්වැල් පිට්ටනිය | පර්චස් 21 |
| කොන්දෙනියවත්ත අංක 141,කැබැල්ලේ පිහිටි ලිඳ | පර්චස් 4.9 |
| දොඩම්පහල උඩමුල්ල දෙනිය ලිඳ | පර්චස් 25 |
| කොන්දෙනිය ලුනුමඩල ගාවවත්ත | පර්චස් 36.62 |
| | අක්කර 04 රූඩ් 01 පර්චස් 120 |